## මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.
## මාතර දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 ජූනි 16 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 ජූනි 16 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත 06 ක් වෙනුවෙන් රු.976,050 ක මුදලක් සභාව වෙත ලැබී තිබුණද ,එකී මුදල ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) කිරිමැටිමල්ල අධිකාරිවිලගම ප්‍රධාන මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.500,000 ක මුදල ණයහිමි උපලේඛනයේ දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු. 96,613 ක් වූ දායක මුදල මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

1.3.2 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 3,761,865 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයයන් 08 කට අයත් රු.47,711,977 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 1.3.4 අනුකූල නොවීම්

විගණනයේදී නිරීක්ෂණය වු නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නිති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති | |
| (i) රීති 17 | ප්‍ර.ස. 21ආකෘති පත්‍රය පරිදි උප පත්‍රිකා පිළිබඳව තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබුණි. |
| (ii) රීති 193 | අයවැයගත පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හී තථ්‍ය ශේෂය සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) රීති 194 සිට 206 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| (i) 2005 මාර්තු 31 දිනැති චක්‍රලේඛ අංක 08/2005 | දේපල ණය සඳහා රාජ්‍ය දායකය රජය විසින් දරනු ලැබියයුතු වුවද, 2009 වර්ෂය වෙනුවෙන් රු.3,949 ක්ද, 2010 වර්ෂය වෙනුවෙන් රු.148,047 ක මුදලක් සභා අරමුදලින් දරා තිබුණි. |
| (ii) 2006 පෙබරවාරි 06 දිනැති චක්‍රලේඛ අංක 05/ 2008 | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාර සභාව වෙතින් සේවාවන් ලබන මහජනතාවට අවශ්‍යතාවයන් කඩිනම්ව, කාර්යක්ෂමව හා අඛණ්ඩවම ඉටු කරන බවට ලිඛිත බැදීමක් ඇතිවන ආකාරයෙන් පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ඇ) 2008 අපේල් 17 දිනැති ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛ අංක 7/1/4/1 | සෑම ක්ෂේත්‍ර නිලධාරියෙකුම කලින් මාසයේ අවසාන දිනයේදී ඉදිරි වැඩ සටහන් අනුමත කරගත යුතු වුවද එලෙස අනුමත කර ගැනීමකින් තොරව ක්ෂේත්‍ර නිලධාරීන් හතර දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී රු.28,771 ක ගමන් වියදම් ගෙවා තිබුණි.<br><br>ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රාජකාරි, වගකිවයුතු නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක්වී නොතිබූ අතර ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීමක්ද සිදුව නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,570,612 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,828,325 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු 2011 මාර්තු 03 දනැති මාගේ ලිපියට අනුව නියමිත ආකෘතියක ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලා තිබූ නමුත් විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු නිරවද්‍ය නොවන බැව් විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් ප්‍රකාශය අනුව 2010 දෙසැම්බර් 31 දනට පැවති තත්ත්වය ඉකුත් වර්ෂය සමග සසඳා සාරාංශ කර පහත දක්වා ඇත.

| විස්තරය | හිඟ ආදායම් | | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස | අඩුවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | 2010 | 2009 | | |
| | රු.'000 | රු.'000 | % | % |
| වරිපනම් | 74 | 63 | 17.20 | - |
| හිඟහිටි ගාස්තු | 271 | 306 | - | 11.39 |
| වෙනත් ආදායම් | 7,131 | 5,463 | 30.51 | - |

#### 2.2.2 හිඟ බදු හා ගාස්තු

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව අයවිය යුතු රු.344,659 ක බදු හා ගාස්තු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2010 ඔක්තෝබර් 20 දිනැති පපා/ගි/06/01/පොදු දරණ ලිපියෙන් හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කරන ලෙස නියම කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 උසාවි දඩ මුදල්

විවිධ ආඥාපනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ 02 ක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු.116,321 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් රු.2,900,000 ක් සහ භාණ්ඩාගාරයෙන් රු.24,000 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 9,046 | 7,261 | 1,785 | 8,083 | 6,714 | 1,369 |
| අනෙකුත් | 4,678 | 4,403 | 275 | 3,989 | 2,997 | 992 |
| උප එකතුව | 13,724 | 11,664 | 2,060 | 12,072 | 9,711 | 2,361 |
| ප්‍රාග්ධන වියදම් | 9,578 | 8,206 | 1,372 | 6,121 | 2,580 | 3,541 |
| මුළු එකතුව | 23,302 | 19,870 | 3,432 | 18,193 | 12,291 | 5,902 |

2.4 මානව සම්පත් කළමනාකරණය

2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතීයික | 07 | 06 |
| ප්‍රාථමික | 12 | 09 |
| වෙනත් | 03 | 08 |
| | 23 | 24 |

(ආ) සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම අනුව කාර්ය මණ්ඩල වැටුප් සඳහා වූ වියදම 7,261,263 ක් වුවද පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණේ රු. 6.162,000 ක් වූයෙන් වෙනස රු.1,099,263 ක වියදම සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

(ඇ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 දනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14, සහ 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරණ චක්‍රලේඛ මගින් පළාත් පාලන ආයතන වලට අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවා ගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධානයට පටහැනිව සේවකයින් 5 දෙනෙකු බඳවාගෙන වැටුප් වශයෙන් රු. 506,036 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. මෙම චක්‍රලේඛ උපදෙස් අභිබවා යමින් බඳවා ගැනීම් සිදුකල හොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද අවධාරනය කර තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය.

2.5.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.45,659 ක් විය.

2.5.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.3,076,750 ක් විය.

2.5.3 සමීක්ෂණය නොකළ වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු.34,246,222 ක් විය.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2.6.1 ඉඩම් අන බෙදුම් හා පොදු පහසුකම් ඉඩම් කොටස් ලැබීම

(අ) සභා බල ප්‍රදේශයේ නාකන්ද ගොඩහේන නැමති ඉඩමට අයත් හෙක්ටයාර් 1.3939 ක් (අක්කර 3 රූඩ් 1 පර්චස් 31.11) විශාල වූ ඉඩම මානක සැලසුම් අංක 10/562 මගින් කැබලි 33 ක්ද, අංක 10/563 මගින් කැබලි 26 ක් ලෙසට අනුබෙදුම් කිරීමට 2010 ජුනි 10 දින සභාපතිවරයා විසින් අනුමත කර තිබුණි.

මේ සම්බන්ධයෙන් නිරීක්ෂනය වු කරුණු මෙසේය.

(i) නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිගේ 1992 සැප්තැම්බර් 30 දිනැති සංවර්ධන රෙගුලාසි චක්‍රලේඛ අංක 6:2 (1) හා එම අධිකාරියේ 1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන ගැසට් පත්‍රයේ නියෝග අංක 22(1) අනුව පර්චස් 551.11 (හෙක්ටයාර් 1.3939 ) කින් මාර්ග සඳහා පර්චස් 15.32 ක් අඩු කළ පසු ඉතිරියෙන් සියයට 10 ක් වු පර්චස් 53.579 ක කොටසක් ප්‍රජා හා විනෝද කටයුතු සඳහා සුදුස ස්ථාන වලින් වෙන් කළ යුතු වුවද කැබලි දෙකකින් වෙන්කර

තිබුණේ පර්චස් 27.91 ක් පමණක් විය. ඒ අනුව පර්චස් 25.669 ක් අඩුවෙන් වෙන්කර තිබූ අතර, එම අහිමි වූ ඉඩම් කොටසේ වටිනාකම රු.1,925,175 ක් විය.

(ii) ඉහත චක්‍රලේඛයේ 2 (III) හා ප්‍රාදේශීය සභා පනතේ 154(6) පරිදි ඉඩම් විකිණීමේදී අයකර ගතයුතු රු.323,064 ක් වූ 1% ක බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) සභාවට ලැබෙන පොදු පහසුකම් සඳහා වූ කොටස වඩාත් ප්‍රශස්ථ වූ ස්ථානයකින් ලබාදිය යුතු වුවද ලැබී තිබූ අංක 2 දරන කැබැල්ල දළ බෑවුම් සහිත එකක් වූ අතර අංක 7 කැබැල්ල පර්චස් 2.65 ක් තරම් කුඩා වූ දළ බෑවුම් සහිත එකක් විය.

(iv) ප්‍රජා හා විනෝද කටයුතු සඳහා ලැබී තිබූ පර්චස් 27 .91 ක කොටස් වෙනුවෙන් රු.80,000 ක් වටිනා අංක 1203 දරන ඔප්පුව ලැබී තිබුණි. එහෙත් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව මෙම ඉඩම් කොටසේ වටිනාකම රු. 2,093,250 ක් වූ අතර අඩුවෙන් දැක්වූ වටිනාකම රු. 2,013,250 ක් විය. මේ හේතුවෙන් රු.40,765 ක මුද්දර ගාස්තු ද සභාවට අහිමි වී තිබුණි.

(v) ඉඩම වෙන්දේසි කිරීමට ප්‍රථම විද්‍යා හා පතල් කාර්යාංශයේ හා මධ්‍යම පරිසර අධිකාරියේ නියමයන් ඉටුකර නොතිබුණු අතර විදුලිය සැපයීමේ කොන්දේසියද ඉටු නොකර ඉඩම් කැබලි අලෙවි කර තිබුණි.

(ආ) <u>ලිබර්ටි ටෙරස් - හොරගොඩ තෙලිජ්ජවිල</u>

මෙම ඉඩම සඳහා මානක සැලසුම් අංක 2959 මගින් අක්කර 6 රූඩ් 2 පර්චස් 10 ක් (හෙක්ටයාර් 2.6557) විශාල වූ ඉඩම 2007 අගෝස්තු 09 දිනැති අංක 2007/93 කමිටු තීරණය මගින් කැබලි 65 කට අනුබෙදුම් කිරීමට සභාපතිවරයා අනුමත කර තිබුණි.

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(i) ඉහත සංවර්ධන රෙගුලාසි 6(iv) පරිදි සියයට 1% බද්ද සඳහා රු.204,949 ක් අයවිය යුතු වුවද අයවී තිබුණේ රු.80,704 ක් පමණක් හෙයින් හිඟ මුදල රු.124,245 ක් විය.

(ii) ඉඩම අනුබෙදීමේදී සභාව වෙත ලැබිය යුතු කොටස සඳහා වූ ඔප්පුව ලැබී නොතිබූ අතර වඩාත් ප්‍රසස්ථ වූ ස්ථානයකින් ලැබිය යුතු අංක 40 කැබැල්ල ගල්කුළු හා බෑවුම් සහිත එකක් විය. තවද අනුබෙදුම් සඳහා අනුමැතිය දීමේදී නියම කල මාර්ගවල තාර දැමීම හා විදුලිය සැපයීමේ කොන්දේසි ඉටුවී නොතිබූ අතර ඉඩම් කොටස සභාව සතු බව දැක්වෙන පුවරුවක් හා ආරක්ෂිත වැටක් ඉදිකර නොතිබූ බව 2011 ජුනි 18 දිනැති භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) <u>තෙලිජ්ජවිල, අකුරුගොඩ මාර්ගයේ පේලිගල හේන ඉඩම</u>

මෙම ඉඩම සඳහා අංක 10සී/2010 මානක සැලැස්ම මගින් අක්කර 03 පර්චස් 5.60 (හෙක්ටයාර් 1.2283) විශාල වූ ඉඩම කැබලි 42 කට අනුබෙදුම් කිරීමට සභාපතිවරයා අනුමත කර තිබුණි.

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(i) ඉහත 2.6.1 ඡේදයේ සඳහන් සංවර්ධන රෙගුලාසි 6.2(1) හා 392/9 දරණ ගැසට් පත්‍රය පරිදි අනුබෙදීම් කරන ඉඩමෙන් වීථි අත්හැරීමෙන් පසු ප්‍රජා හා විනෝද කටයුතු සඳහා පර්චස් 43.97 ක් ලැබිය යුතු වුවද කැබලි අංක 20 මගින් ලැබී තිබුණේ පර්චස් 10 ක් පමණක් හෙයින් අඩුවෙන් ලැබී තිබූ ඉඩම් ප්‍රමාණය පර්චස් 33.97 ක් විය. මෙම ඉඩම් කොටසේ අගය රු.38,895 ක් විය.

(ii) සභාපතිවරයාගේ 2010 සැප්තැම්බර් 08 දිනැති ලිපියෙන් අංක 27 දරණ රූඩ් 01 පර්චස් 3.65 ක් විශාල වූ කොටස සංරක්ෂිත කලාපයක් ලෙසට වෙන් කර තැබීමට නියම කර තිබුණි. සභාවට පැවරිය යුතු කොටස ඔප්පුවකින් පවරා නොතබූ අතර අංක 27 සංරක්ෂිත කොටසට පමණක් 2000 ජුලි 24 දිනැති අංක 209 දරන තෑගි ඔප්පුව මගින් පවරා තිබුණි.

(iii) මෙම ඉඩම අනුබෙදීම් සම්බන්ධයෙන් 2011 ජුනි 28 දිනැති භෞතික පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු මෙසේය.

- සංවර්ධනය කල ඉඩමේ අභ්‍යන්තර මාර්ග හා කාණු පද්ධතිය තාක්ෂණ නිලධාරීන්ගේ උපදෙස් පරිදි නියමිත ප්‍රමිතියෙන් ඉදිකර නොතිබුණි.
- අභ්‍යන්තර කාණු පද්ධතිය හා සම්බන්ධ බෝක්කුව නිසිපරිදි ඉදිනොකිරීමෙන් ජලය ගලායාම අවහිර වී තිබුණි.
- මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂවරයාගේ 2010 ජුලි 10 දිනැති ලිපිය මගින් නියම කර තිබූ පැති බැම්ම ඉදිකර නොතිබණි.

(ඇ) ඇල්ගිරිය ප්‍රජා ශාලාව සඳහා ඉඩමක් පවරා ගැනීම

නොබෙදූ ඉඩමක් වූ මෙම ඉඩමේ පර්චස් 08 ක් එක් අයිතිකරුවෙකු විසින් තෑගි ඔප්පුවකින් සභාවට පවරා දී තිබූ අතර සභාව එහි ප්‍රජාශාලාවක් ඉදිකර තිබුණි. මෙම ප්‍රජා ශාලාව ඉදිකිරීමට එරෙහිව මාතර දිස්ත්‍රික් අධිකරණයේ නඩු 02 ක් හා, අභියාචනා අධිකරණයෙහි එක් නඩුවක්ද පවරා තිබුණි.

### 2.6.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාද

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා ප්‍රතිපාදන යටතේ රු.231,000 ක් ව්‍යාපෘති 4 ක් සඳහා ලැබී තිබූ අතර එම ව්‍යාපෘති 2011 ජුනි 23 දින වන විටද ක්‍රියාත්මක කර නොතිබුණි.

### 2.6.3 වීථි පහන් නඩත්තුව.

සභා බල ප්‍රදේශයේ වීථි පහන් නඩත්තුව පිළිබඳව 2011 ජුනි මාසයේදී සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් තොරතුරු අනාවරණය විය.

(i) වීථි පහන් නඩත්තුව සම්බන්ධයෙන් විදුලි උපාංග මිලදී ගැනීමේදී අවශ්‍යතාවය පරිදි නඩත්තු විදුලි කාර්මිකගේ ඉල්ලීම හා ඒ සඳහා කාර්මික නිලධාරියාගේ අනුමැතිය තුලින් ඒවා මිලදී ගැනීම සිදුකල යුතු වුවත් එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ii) සභා බල ප්‍රදේශය තුල නඩත්තුව සිදුවන වීථි පහන් එකිනෙක වෙන්කොට හඳුනාගැනීම සඳහා අංක හෝ සංකේත ක්‍රමයක්ද එක් එක් වීථි පහන් සඳහා විදුලි බුබුළු හා අනෙකුත් උපාංග සවි කිරීම් වෙනුවෙන් ලේඛණයක්ද නඩත්තු කර නොතිබුණි.

(iii) සභා බල ප්‍රදේශයේ වීථි පහන් නඩත්තුව සඳහා රු.361,472 ක් වැයකර තිබුණද ලංකා විදුලි බල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය වී තිබුණේ රු.21,456 ක් පමණක් වූ හෙයින් රු.340,016 ක වියදම සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

3. පද්ධති හා පාලන.

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) වත්කම් පාලනය
(ඉ) වියදම් පාලනය